PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2026.09.24

අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා,

ජනාධිපති කාර්යාලය,

කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

**මහජන අභිලාෂයන්ට සාධාරණයක් වන අයුරින් වඩා විනිවිදභාවයෙන් යුතු අල්ලස් හෝ දූෂණ විරෝධී පනතක් වෙනුවෙන් සංශෝධන ගෙන ඒම.**

ඔබතුමන්ගේ නායකත්වය යටතේ වත්මන් ආණ්ඩුව අල්ලස් හා දූෂණය පිටු දැකීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදෙමින් කටයුතු කිරීම අපගේ ගෞරවයට හේතුවන්නකි. එය මේ රටේ බහුතරයක් ජනතාවත් බොහෝ සිවිල් සංවිධානත් අපේක්ෂා කළ කරුණකි. ඒ සඳහා පැහැදිළි ජන වරමක් ද ඔබතුමන් ප්‍රමුඛ රජයට ලබාදෙන ලදි.

එවැනි පරිසරයක් තුළ ගෙන එන ලද දූෂණ විරෝධී පනත් කෙටුම්පතෙහි ඉතා සාධනීය කරුණු මෙන්ම එකී අභිලාෂයන්ට හානිකර කරුණු ගණනාවක්ද අඩංගු වී ඇත. මේ පිළිබඳව අප ඔබතුමා මීට පෙර ද දැනුවත් කිරීමට කටයුතු කළ අතර එකී කරුණු පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයට ද පෙත්සමක් ඉදිරිපත් කරන ලදි. මේ වන විට අධිකරණයේ තීන්දුව ද ලැබී ඇති අතර එක් කරුණක් හැර සෙසු කරුණු සඳහා ජනමත විචාරණයකින් තොරව පාර්ලිමේන්තුව හරහා සම්මත කළ හැකි බවට අධිකරණයේ මතය ප්‍රකාශ ප්‍රකාශ වී ඇත. අප ශ්‍රේෂ්ඨාධිකරණයේ මතයට ගරු කරන අතර එකී තීන්දුවට යටත්ව පාර්ලිමේන්තුව තුළ මෙම පනත් කෙටුම්පත සම්මත කිරීමට පෙර පහත සඳහන් කරුණු කෙරෙහි ඔබතුමාගේත් පාර්ලිමේන්තු කණ්ඩායමේත් අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

අතීතයේදී පැවැති තත්ත්වය වූයේ පුරවැසියන්ට, රාජ්‍ය මුදල් කළමණාකරණය හා ඒ පිළිබඳව තීන්දු ගන්නා දේශපාලකයින්ගේ හා රාජ්‍ය නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ යම් මුදලක් ගෙවීමෙන් අනතුරුව ලබාගත හැකි වුවද මහජන සුබසිද්ධිය සඳහා ප්‍රසිද්ධ කිරීමට නොහැකි වීමයි. නමුත් ඒ පිළිබඳව සමාජයෙන් මතු වූ බරපතල සංවාදයක ප්‍රතිපලයක් ලෙස වත්කම් බැරකම් වල තොරතුරු ලබාගෙන ඒවා ප්‍රසිද්ධ කිරීමට පුරවැසියන්ට අවකාශය සැලසුනි. එහෙත් යෝජිත කෙටුම්පත මගින් එවැනි තොරතුරු විශ්ලේෂණය කිරීමට හා ජනතා අවධානයට ගෙන ඒමට තිබූ අවකාශය අහිමිවී ඇත. අල්ලස් හා දූෂණය පිටු දැකීමේදී නීතිය ක්‍රියාත්මක කිරීම මෙන්ම දූෂණය පිළිබඳ සමාජ කතිකාවත ද, සමාජයට නිරාවරණය වීම තුළින් ඇතිවන සමාජ බලපෑම ද අතිශය තීරණාත්මක ය. චේතනාන්විතව වැරදි තොරතුරු, සමාජගත කිරීම හෝ තොරතුරු වැරදි ලෙස අර්ථකතනය කිරීම මගින් දේශපාලනඥයෙකු හෝ නිලධාරියෙකු අපහසුතාවයට පත්කරන්නේ නම් ඒ සඳහා ද නීතිමය කටයුතු සිදු කිරීම පිළිබඳ අපගේ විරෝධතාවයක් නොමැත.

එමෙන්ම 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80 (බ) වගන්තිය අනුව රජය හෝ රජයේ සංස්ථාවක් මගින් 25% කට නොඅඩු කොටස් දරන්නා වූ ආයතන ප්‍රධානීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු බවට වූ සීමාව 50% දක්වා වැඩිකර ඇත. එනයින් බලන කල 49.9% දක්වා අයිතිය ඇති රාජ්‍ය ප්‍රධානීන් සිය වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීමේ අවශ්‍යතාවය පැන නොනගී. එය අල්ලස් හා දූෂණය පිටු දකිමින් සුපිළිපන් දේශයක් ගොඩ නැගීමේ මූලික අභිප්‍රායට බාධාකාරී වගන්තියක් බව බැලූ බැල්මටම පෙනෙන්නට තිබේ.

දූෂණ විරෝධී සංශෝධිත පනතේ  ඇතැම් ප්‍රතිපාදන වලින් පෙනී යනු ලබන්නේ එක් පුද්ගලයෙකුට වඩා වැඩි බලයක් කේන්ද්‍රගත වී ඇති තත්ත්වයක් නිර්මාණය වන බවයි. වත්මන් අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා පිළිබඳව අපට ප්‍රසාදයක් ඇතත් එක් පුද්ගලයෙකු වටා වැඩි බලයක් කේන්ද්‍රගත වීම යහපත් ප්‍රවණතාවයක් නොවන බව අපගේ විශ්වාසයයි. විශේෂයෙන්ම නීති සම්පාදනය කල යුත්තේ වත්මන් තත්ත්වයන්ට අනුරූප වන පරිදි පමණක් නොව අනාගතයේදී නිර්මාණය විය හැකි අභියෝගයන්ද සලකා බලමින් බව අතීත අත්දැකීම් අපට සිහිපත් කරවයි.

වත්මන් රජය අල්ලසට දූෂණයට එරෙහිව ක්‍රියාමාර්ග ගනිමින් සිටින වටපිටාවක ඒ පිළිබඳව මහජනතාවද බලාපොරොත්තු සහගතව සිටින මොහොතක අගති විරහිතව අප ඔබතුමාගෙන් ඉල්ලා සිටිනුයේ උක්ත කරුණු පිළිබඳව ඔබතුමාගේ සහ පාර්ලිමේන්තු කණ්ඩායමේ විශේෂ අවධානය යොමු කර පාර්ලිමේන්තුවේ සංශෝධන අවස්ථාවේදී ජනතා අභිලාෂයන්ට සාධාරණයක් ඉෂ්ඨ වන අයුරින්, සුදුසු සංශෝධනයන් ගෙන එමින් මහජනතාවට වගකියන සහ වඩා විනිවිදභාවයෙන් යුතු සංශෝධනයන් ගෙන ඒමට පියවර ගන්නා ලෙසය.

ස්තූතියි!

මෙයට,

විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂ

පිටපත් :

**සියලුම මාධ්‍ය ආයතන හා උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන් සඳහා**